00010

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩ සටහන - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2013

ESU 3117 - ළමා අයිතිවාසිකම්

කාලය - පැය තුනයි.

---

දිනය - 2013.03.08 වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30

---

I වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. "ළමා අයිතිවාසිකම්" යන්න නිර්වචනය කරන්න.

02. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ හතර (04) කවරේ ද?

03. ළමා අයිතීන් පාලනය කෙරෙන ප්‍රධාන මූලධර්ම තුන (3) නම් කරන්න.

04. ළමයින්ට හිමිවිය යුතු සහභාගිත්ව අයිතිවාසිකම් තුනක් (3) නම් කරන්න.

05. ළමයින් සතු එක් අයිතිවාසිකමක් නම් වර්ධනය හා සංවර්ධනය සඳහා ඇති අයිතියයි. මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය බහුලව සිදුවන පරිසරයක් නම් කර එය සිදුවන ප්‍රධාන ආකාර හතරක් (4) දක්වන්න.

07. එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුව සුරක්ෂණය ලබා දිය යුතු ළමයින් කාණ්ඩ පහක් (5) නම් කරන්න.

08. ළමා අයිතිවාසිකම් පිළිබඳ සන්නිවේදන අංශයන් හි ඵලදායීතාවට බාධා පමුණුවන සාධක තුනක් (3) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II වන කොටස

09. i. ළමයාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 08)

ii. මෙම මූලධර්මය පදනම් කරගෙන අධිකරණය විසින් ළමා රැකවරණය හා භාරකාරත්වය පිළිබඳව ප්‍රශ්න විසඳන අන්දම නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

10. i. විශේෂ අවස්ථාවන් හි පසුවන ළමයින් ලෙස සලකනු ලබන්නේ කවුරුන් ද? (ලකුණු 08)

ii. විශේෂ අවස්ථාවන් හි පසුවන ළමයින්ගේ සංවර්ධනයෙහි ලා වගකීමක් දරණ කාරක හතර (4) ක් නම් කර ඔවුන්ගේ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. i. ළමා අපයෝජනය යනු කුමක් ද? (ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය සිදුවන ප්‍රධාන ස්වරූප කවරේ ද? (ලකුණු 07)

iii. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය වැලැක්වීම අරමුණු කරගත් එක් පනතක් සඳහන් කොට එහි අන්තර්ගත කරුණු කෙටියෙන් දක්වන්න. (ලකුණු 08)

12. i. ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමේ දී මාධ්‍යවල පවතින දුර්වලතා පහක් (5) නම් කරන්න. (ලකුණු 10)

ii. ඉහත සඳහන් එක් එක් දුර්වලතාවක් ඇතිවීමට හේතු පරීක්ෂා කරන්න. (ලකුණු 10)

13. "සෑම ගුරුවරයකුම ළමා අයිතිවාසිකම් පිළිබඳ සමස්තාවබෝධය ලැබීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රියජනක වීමට මහෝපකාරී වේ." විභාග කරන්න. (ලකුණු 20)

14. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම හතරක් (04) සඳහා කෙටි සටහන් ලියන්න.

i. ළමා අයිතිවාසිකම් සුරැකීමේදී බාධකයක් ලෙස සමාජයීය හා ආර්ථික දුරස්ථභාවය

ii. ළමයින් දරුකමට හදා ගැනීම

iii. සරණාගත ළමුන් හා ඔවුන්ගේ අයිතිවාසිකම්

iv. අප රටේ බ්‍රිතාන්‍ය පාලන යුගය හා ළමා අයිතිවාසිකම්

v. ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂණ අධිකාරිය (ලකුණු 4 x 5= 20)

හිමිකම් ඇවිරිණි.

00010

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**BACHELOR OF EDUCATION DEGREE PROGRAMME**

**(NATURAL SCIENCE)**

**FINAL EXAMINATIONS – 2013**

**ESU3117 – CHILD RIGHTS**

**DURATION – THREE (03) HOURS.**

Date: 08$^{TH}$ MARCH 2013 Time: 1.30 p.m. 4.30 p.m.

**Answer all questions in Part I & three (03) questions from Part II.**

## PART I

01. Define the term 'Child Rights'

02. What are the four(04) clusters of rights specified in the United Nations (U.N) convention on the rights of the child?

03. Name the three(03) main principles that govern Child Rights.

04. Name three(03) important participatory rights the children are entitled to.

05. Explain the following statement briefly. "The right to growth and development is one of the rights of children"

06. Name an environment where child abuse is prevalent and list four (04) most prevalent forms of it in Sri Lanka.

07. Name five (05) groups of children who require protection according to the United Nations Convention.

08. State three (03) factors that obstruct the effectiveness of communication aspects of Child Rights.

(5 x 8 = 40 marks)

## PART II

09. i. What is meant by the principle of best interests of the child?
(08 marks)
ii. Discuss how Courts of Law settle custody and guardianship issues on the basis of this principle citing examples.
(12 marks)

10. i. Who are the children considered as those placed in special circumstance.
(08 marks)
ii. State four (04) agents who are responsible for the development of children in special circumstances and explain their functions.
(07 marks)

11. i. Explain what is meant by Child Abuse.
(05 marks)
ii. What are the major forms of child abuse found in Sri Lanka.
(07 marks)
iii. Describe in brief the content of one Act of Parliament which seeks to prevent child abuse in Sri Lanka.
(08 marks)

12. i. Name five (05) draw backs of the media in raising awareness of child rights.
(10 marks)
ii. Examine the reasons for each drawback mentioned above.
(10 marks)

13. "Awareness of the overall idea on child rights helps to have an enjoyable teaching learning process". Examine this idea.
(20 marks)

14. Write short notes on any four (04) of the following.
i. Social and economic distance as a barrier to ensuring Child Rights.
ii. Adoption of Children.
iii. Refugee children and their Rights.
iv. The British rule in our country and Child Rights.
v. Child Protection Authority of Sri Lanka.
(4 x 5 = 20 marks)

*-Copyrights reserved -*